සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 8 - 2019

නම/විභාග අංකය :....................................... කතෝලික ධර්මය කාලය: පැය 02යි.

## I කොටස

සැලකිය යුතුයි :

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 10 තෙක් නිවැරදි පිළිතුර තෝරා එම පිළිතුර යටින් ඉරක් අඳින්න.

---

(1) ජේසුස් වහන්සේගේ උපත පළමුවෙන්ම ප්‍රකාශ කළේ කාහට ද?

1. රජවරුන්ට ය. 2. දේවදූතයන්ට ය.
3. දුප්පත් එඬේරුන්ට ය. 4. පඬිවරුන්ට ය.

(2) ස්නාවක ජොහාන්තුමා ජුදා නායකත්ව දුටුවේ,

1. හිවලුන් ලෙස ය. 2. පොළඟුන් ලෙස ය.
3. සර්පයින් ලෙස ය. 4. වන මෘගයන් ලෙස ය.

(3) ප්‍රථම වරට පූප හා මිදි යුෂ ගෙන දෙවියන් වහන්සේට යාගයක් ඔප්පු කළේ,

1. පූජක මෙල්කිසෙදෙක් ය. 2. පූජක සාමුවෙල් ය.
3. පූජක සෙකරියස් ය. 4. පූජක මෝසස් ය.

(4) විශ්වය ගලවා ගැනීමේ කාර්යය පැවරී ඇත්තේ,

1. ශුද්ධාත්මයාණන් වහන්සේට ය. 2. පුත්‍රයාණන් වහන්සේට ය.
3. දෙවියන් වහන්සේ ට ය. 4. සුරදූතයන්ට ය.

(5) ඉශ්‍රායෙල් ජනතාව බබිලෝනියාවේ වහලුන් බවට පත්වූයේ,

1. මිශ්‍ර විවාහ සිදුකරගත් නිසා ය.
2. දෙවියන් වහන්සේව ප්‍රතික්ෂේප කළ නිසා ය.
3. තම වංශයේ මිනිසුන් සමග ආරවුල් ඇති කරගත් නිසා ය.
4. මිථ්‍යා ඇදහිලි අනුගමනය කළ නිසා ය.

(6) දේව නාමය අගරු ලෙස භාවිතා නොකළ යුතු බවට පෙන්වා දෙනුයේ,

1. දෙවන පනත මගින් 2. පළමුවන පනත මගින්
3. හයවන පනත මගින් 4. තුන්වන පනත මගින්

(7) සියලු වන්දනාවේ උල්පත හා මුදුන්කඩ ලෙස සලකනු ලබන්නේ,

1. දස පනත යි. 2. දේව ප්‍රසාද නිධානය යි.
3. දිව්‍ය පූජාව යි. 4 දිව්‍ය සත්ප්‍රසාදය යි.

(8) අතීන්ද්‍රිය ක්‍රිස්තු දේහයේ අවයව ලෙස සලකනු ලබන්නේ,

1. කිතුනු ජනතාව ය. 2. පැවිදි ජනතාව ය.
3. අපෝස්තුළුවරුන් ය. 4. ආදි පියවරුන් ය.

(9) දිව්‍ය පූජාවේ පවතින පිළිවෙත් ගණන වන්නේ,

1. තුනකි 2. පහකි. 3. දෙකකි 4. හතරකි.

(10) දිවුරුම අනුමත කරනු ලබන තැනැත්තකු වන්නේ,

1. ජොහන් තුමා ය. 2. පේදුරු තුමා ය.
3. ලූක් තුමා ය. 4. පාවුලු තුමා ය.

- අංක 11 සිට 15 දක්වා නිවැරදි වාක්‍යයට ( ✓ ) ලකුණ ද වැරදි වාක්‍යයට ( ✕ ) ලකුණ ද යොදන්න.

(11) ශුද්ධ වූ අගස්තීනු මුනිතුමා ශුද්ධ ත්‍රීත්වයේ අභිරහස වටහා ගත්තේ ය. ( )

(12) මිථ්‍යා ඇදහිලි සිදු කිරීම තුන්වන පනතට විරුද්ධ ය. ( )

(13) නව ගිවිසුම තුළ දිවුරුම අනුමත කර ඇත. ( )

(14) පූජක හා පැවිදි පිරිස දිනපතා යාම යැදුම සිදුකරයි. ( )

(15) බාරයක් කඩකිරීම බරපතල වරදක් නොවේ. ( )

- අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරා ලියන්න.

**(ප්‍රතිවාදීන් / දේව වන්දනාත්මක මෙහෙයන් / ඒක දේවවාදය / ශුද්ධාත්මයාණන්ගේ / දිව්‍ය පූජා)**

(16) ජේසුස් වහන්සේ ........................................................ ආනුභාවයෙන් පිළිසිඳ ගත්තේ ය.

(17) රූප වන්දනාවෙන් ........................................................ ප්‍රතික්ෂේප කෙරේ.

(18) දෙවියන් වහන්සේ ........................................................ නොඉවසන සේක.

(19) දේව වන්දනාවේ උතුම්ම පිළිවෙත ........................................................ යාගය වේ.

(20) කිතුණු ජීවිතය ශුද්ධවත් කිරීමට ........................................................ උපකාරී වේ.

$(2 \times 20 = 40)$

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) (i) ලූක් ශුභාරංචිය හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.

(ii) සෙකරියස් තුමාගේ ගොළු බව දුරු වූයේ කුමන අවස්ථාවකින් පසුව ද? කරුණු දෙකක් ලියන්න.

(iii) හෙරෝද්ගේ උපන් දිනය සැමරීමට පැමිණි හෙරෝදියස්ගේ දුව ඔහුගෙන් ඉල්ලූයේ කුමක් ද?

(iv) දේව රාජ්‍යය යනු කුමක් ද? කරුණු දෙකක් ලියන්න.

(v) ශුද්ධ වූ ලූක් තුමා පමණක් සඳහන් කරන උපමා දෙකක් ලියන්න.

(vi) මාරුත දමනය ප්‍රතිහාර්යයෙන් පෙන්වන කරුණු දෙකක් ලියන්න.

(vii) දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට පෙර සූදානම් විය යුතු ආකාර දෙක ලියන්න.

(viii) අභිවෘද්ධි ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය ලබා ගැනීමට අවශ්‍ය සුදුසුකම් දෙකක් ලියන්න.

(ix) පියාණන් වහන්සේගේ කාර්යය භාරය කුමක් ද?.

(x) දේව වන්දනාවේ ප්‍රධාන අංග දෙකක් ලියන්න.

$(2 \times 10 = 20)$

(02) (i) අන්තිම රාත්‍රී භෝජන අවස්ථාවේ ජේසුස් වහන්සේ ස්ථාපිත දේව ප්‍රසාද නිධාන දෙක කුමක් ද? (ල. 2)

(ii) දිව්‍ය සත්ප්‍රසාදයට පූර්ව සලකුණු 3 ක් සඳහන් කරන්න. (ල. 3)

(iii) දිව්‍ය සත්ප්‍රසාදයෙන් ජීවමාන වූ ජේසුස් වහන්සේ ලබාගත් ඔබ කරන යහපත් ක්‍රියා 5 ක් ලියන්න. (ල. 5)

(03) (i) ශුද්ධාත්ම ඵල 02 ක් ලියන්න. (ල. 2)

(ii) අභිවෘද්ධි ආලේපය දානය කළ හැකි පුද්ගලයින් තිදෙනෙක් නම් කරන්න. (ල. 3)

(iii) අභිවෘද්ධි ආලේපය ලැබුවකු ලෙස ඔබ සතු යුතුකම් 5 ක් ලියන්න. (ල. 5)

(04) (i) ශුද්ධාත්මයාණන් වහන්සේගේ කාර්ය භාරය කුමක් ද? (ල. 2)

(ii) ත්‍රිත්වික දෙවියන් වහන්සේ පවුල තුළ ක්‍රියාකරන ආකාර 3 ක් ලියන්න. (ල. 3)

(iii) ත්‍රිත්වික දෙවියන් වහන්සේට ඔබේ පවුල කැපකර කරන කෙටි යාච්ඤාවක් ලියන්න. (ල. 5)

(05) (i) කතෝලික විශ්වාසයට අනුව අප නොකළ යුතු දේවල් 2 ක් ලියන්න. (ල. 2)

(ii) කතෝලික විශ්වාසයට විරුද්ධව පැන නගින පරීක්ෂා 3 ක් ලියන්න. (ල. 3)

(iii) දෙවියන් වහන්සේට සමීප වීමට කළ යුතු දේවල් 5 ක් ලියන්න. (ල. 5)

(06) (i) ඉරුදින ණය යුක්තිය වන්නේ කුමක් ද? (ල. 2)

(ii) ඉරුදින වර්තමානයේ දෙවිඳුන්ට කැප කළ දිනයක් ලෙස නම් කිරීමට හේතු වූ සුවිශේෂී සිදුවීම් තුනක් ලියන්න. (ල. 3)

(iii) ඉරුදින ශුද්ධවත්ව ගත කිරීමට ඔබට සිදු කළ හැකි ක්‍රියාකාරකම් පහක් ලියන්න. (ල. 5)

(07) (i) දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් දෙක ලියන්න. (ල. 2)

(ii) දිව්‍ය පූජාවට අර්ථාන්විතව සහභාගී වීමට ඔබට කළ හැකි කාර්යයන් 3 ක් ලියන්න. (ල. 3)

(iii) දිව්‍ය පූජාව අවසනයේ ධර්මදූත කාර්යය සඳහා පිටත්වන ඔබ එම කාර්යය සිදු කරන අයුරු කරුණු 5 කින් දක්වන්න. (ල. 5)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 8 - 2019

## කතෝලික ධර්මය - පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| (1) - 3 | (6) - 1 | (11) - ✕ | (16) - ශුද්ධාත්මයාණන්ගේ |
| (2) - 2 | (7) - 3 | (12) - ✕ | (17) - ඒකදේවවාදය |
| (3) - 1 | (8) - 1 | (13) - ✕ | (18) - ප්‍රතිවාදීන් |
| (4) - 2 | (9) - 2 | (14) - ✓ | (19) - දිව්‍ය පූජා |
| (5) - 4 | (10) - 4 | (15) - ✕ | (20) - දේව වන්දනාත්මක මෙහෙයක් |

(2 × 20 = 40)

### II කොටස

(01) (i)
* යාච්ඤාවේ ශුභාරංචිය
* කාන්තාවන්ගේ ශුභාරංචිය
* අන්‍ය ජාතිකයන්ගේ ශුභාරංචිය
* දයාවේ ශුභාරංචිය
* ශුද්ධාත්මයාණන්ගේ ශුභාරංචිය

(ii) ස්නාවක ජොහාන් තුමා උපත ලබා අටවන දිනයේ දී චර්මච්ඡේදන පිළිවෙත සිදු කිරීමට හා නම් තැබීමට සූදානම් වූ අවස්ථාවේ.

(iii) "ස්නාවක ජොහාන්තුමාගේ හිස තැටියක ලා දුන මැනවැ'යි යනුවෙන්

(iv)
* දෙවියන් වහන්සේගේ පාලනයට නතු වීමයි.
* පාපය ඉවතලා දේව වරප්‍රසාදය තුළ ජීවත් වීමයි.
* දේව අභිමතයට මිනිස් සමාජය නතු වීමයි. (පිටු අංක 36)

(v)
* යහපත් සමාරියා පිළිබඳ උපමාව
* නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාව
* ධනපතියා හා ලාසරස් පිළිබඳ උපමාව

(vi)
* ජේසුස් වහන්සේ සැබෑ දේව පුත්‍රයාණන් බව
* ස්වභාව ධර්මය පවා උන්වහන්සේට කීකරු වන බව

(vii)
* ආත්මික සූදානම
* ශාරීරික සූදානම

(viii)
* ප්‍රසාද ස්නාපනය ලබා තිබීම
* වයස අවුරුදු 14 සම්පූර්ණ වීම
* නිසි ධර්මෝපදේශයක් ලබා සූදානම් වීම (පිටු අංක 60)

(ix) විශ්වය මවා පරිපාලනය කිරීමේ කාර්යය

(x)
* දිව්‍ය පූජාව
* දේව ප්‍රසාද නිධාන
* යාම යැදුම

(2 × 10 = 20)

(2) (i) * දිව්‍ය සත්ප්‍රසාදය
* පූජාත්වරය
(ii) * මෙල්කිසදෙක්ගේ යාගය
* පූප වැඩි කිරීමේ ප්‍රතිහාර්යය
* මන්නා භෝජනය
* ඊශ්‍රායෙල් ජනතාවගේ පාස්කු භෝජනය
(iii) * ජේසුස් වහන්සේ මෙන් කැඩෙමින් බිඳෙමින් අන් අයගේ අවශ්‍යතා පිළබඳ සොයා බැලීම
* නිරන්තර යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම
* දිව්‍ය සත්ප්‍රසාදය ගෞරවාන්විතව ලබා ගැනීම
* දේව ආදරය, කරුණාව තුළ ජීවත් වෙමින් අන් අයට ද එය ලබාදීම

(ලකුණු $2 + 3 + 5 = 10$)

(3) (i) * ස්නේහය
* ප්‍රීතිය
* සමාදානය
* ඉවසීම
* කරුණාව
* යහපත්කම
* නොබිඳෙන දිරිය
* සාන්තදාන්තකම (පිටුව 61)
(ii) * රාජගුරු ප්‍රසාදීන් වහන්සේ
* මීසම් සේවක පියතුමා
* මරණාසන්න පුද්ගලයෙකුට - ඕනෑම පුද්ගලයෙකුට
* විශේෂ අවසරයලත් පූජාප්‍රසාදිතුමෙකුට
(iii) * තමාගේ විශ්වාසය ගැඹුරු කර ගැනීම සඳහා උන්වහන්සේ පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම.
* ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ස්ථිර ප්‍රේමයක් ඇති කරගෙන එලෙස ජීවත් වීම.
* අවශ්‍ය අවස්ථාවලදී ක්‍රිස්තු ප්‍රේමය සඳහා නැගී සිට එයට සාක්ෂි දැරීම.
* ක්‍රිස්තුන් වහන්සේ හා එක් වී ලෝකය ශුද්ධවන්තභාවයට පත් කිරීම සඳහා සෑම උත්සහයක්ම දැරීම
* පරිණත කිතුණුවකු ලෙස වචනයෙන්, ක්‍රියාවෙන් සාක්ෂි දැරීම (පිටුව 62)

(ලකුණු $2 + 3 + 5 = 10$)

(4) (i) විශ්වය ශුද්ධවත් කිරීමේ කාර්යය පැවරී ඇත.
(ii) * පවුලේ එකිනෙකා අතර සබැඳියාව කෙරෙහි ආශිර්වාදය
* ක්‍රිස්තුන් වහන්සේගේ ආදරය දෙමාපියන් දරුවන් වෙත දානය කිරීම
* නොබිඳෙන සාංසික ජීවිතයක් අත්කර දීම (පිටුව 70)
(iii) සිසුවා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබා දෙන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

(5) (i) * නැකැත් බැලීම
* බලිතොවිල්
* ලග්න පලාපල (පිටු අංක 73)
(ii) * මුදල
* බලය
* වස්තුව (ලෞකික දේවල්) (පිටුව 73)

(iii) * එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළ යුතු ය.
* ඒක දේව වන්දනාවෙන් දේව සබඳතාව වර්ධනය කරගතයුතුය.
* මිත්‍යා ඇදහිලිවලින් වැළකී අන් අය ද ඉන් බේරා ගැනීම
* යක්ෂ, භූත මායම් ඇති බව විශ්වාස නොකළ යුතු ය.
* මෙලොව ඇති සියලු ම දෑ දෙවියන් වහන්සේ ඉදිරියේ දූවිල්ලකට සමාන බව පිළිගත යුතු ය.

(ලකුණු $2 + 3 + 5 = 10$)

(6) (i) * ඉරුදින මුළු දිව්‍ය පූජා යාගයට සහභාගී විය යුතුයි. (පිටුව 82)

(ii) * ජේසුස් වහන්සේ උත්ථාන වූ දිනය
* උත්ථාන වූ ජේසුස් වහන්සේ වැඩිපුරම දර්ශනය වූ දිනය
* ශුද්ධාත්මාගමනය සිදු වූ පෙන්තකෝස්ත දිනයයි. (පිටුව 82)

(iii) * දිව්‍ය පූජාවට භක්තිමත්ව සහභාගී වීම
* දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම
* අසරණයන් පිහිට වීම
* රෝගී වූවන් බැලීමට යාම
* මීසමේ කටයුතුවලට දායක වීම

සිසුවා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබාදෙන්න.

(ලකුණු $2 + 3 + 5 = 10$)

(7) (i) * දේව වාක්‍ය පිළිවෙත
* ස්තෝත්‍ර යාගික පිළිවෙත

(ii) * සංවර ඇඳුමෙන් පූජාවට සහභාගී වීම
* විශ්වාසයෙන් යුතුව පූජාවට සහභාගී වීම
* දිව්‍ය පූජාවට පිළිතුරු ලබාදීම

සිසුවා ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ලබාදෙන්න.

(iii) * සාමයෙන් ජීවත්වීම
* සාමයෙන් දිවි ගෙවීමට අන් අයවද යොමු කිරීම
* දේව පණිවිඩය අන් අය හා බෙදා ගැනීම
* දිව්‍ය පූජාවේ අර්ථවත් බව පහදා දීම
* දිව්‍ය පූජාවට සහභාගී නොවන්නන් ඒ සඳහා සහභාගී කරවා ගැනීම.

(ලකුණු $2 + 3 + 5 = 10$)